*සැ. යු.* — 2014.03.21 දින පළ වූ අංක 1,855 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV *(අ)* කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,856 - 2014 මාර්තු මස 28 වැනි සිකුරාදා - 2014.03.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 466 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අප්‍රේල් මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අප්‍රේල් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

465- B 80825— 2,920 (2014/03)
F 1 -

# පළාත් සභා නිවේදන

**වයඹ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 1995 අංක 05 දරන වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ කරනු ලබන නිවේදනය

වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය, මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍ය නීතිඥ දයාසිරි පද්මකුමාර ජයසේකර වන මම, වයඹ පළාත් සභාවේ 1995 අංක 05 දරන වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 05 (01) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, සංස්ථාපනය කරන ලද වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවට එකී ප්‍රඥප්තියේ 05 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත නම් සඳහන් තැනැත්තන් 2014.01.01 දින සිට 2016.12.31 වැනි දින දක්වා කාලය සඳහා වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් පත් කරන ලද බැව් මෙයින් නිවේදනය කරමි.

තව ද, එකී ප්‍රඥප්තියේ 07 වැනි වගන්තියේ ප්‍රකාර ඉහත කී කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නීතිඥ ලක්මාල් වික්‍රමරච්චි මහතා 2014.01.01 දින සිට 2016.12.31 වැනි දින දක්වා කාලය සඳහා පත් කරන ලද බව ද, මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ දයාසිරි පද්මකුමාර ජයසේකර,<br>
වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා<br>
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,<br>
පළාත් පාලන හා පළාත් පරිපාලනය, මානව සම්පත්,<br>
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර,<br>
සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර<br>
සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ<br>
අමාත්‍ය (වයඹ පළාත).

2014 මාර්තු මස 04 වැනි දින.

| *නම* | *ලිපිනය* |
|---|---|
| 1. නීතිඥ ලක්මාල් වික්‍රමරච්චි මයා | අංක 881, බෝවත්ත, බිංගිරිය |
| 2. නීතිඥ රංජනී හේරත් මිය | අංක 165, වඳුරාගල, කුරුණෑගල |
| 3. නීතිඥ තුෂාර හේරත් මයා | මිතලව, හල්මිල්ලවැව. |

03-989

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.